සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව / தென் மாகாணக் கல்வித் திணைக்களம்
DEPARTMENT OF EDUCATION-SOUTHERN PROVINCE

අවසාන වාර පරීක්ෂණය - 2021

09 ශ්‍රේණිය | බුද්ධ ධර්මය | කාලය පැය 02යි.

නම/ විභාග අංකය :- ........................................................................................................................

**I කොටස**

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- ප්‍රශ්න අංක 01 සිට 20 දක්වා නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

(1) මහණෙනි, කරුණාවෙන් ඔබ අමතමි. සියලු සංස්කාර ධර්මයෝ නැසෙන සුළුය. එබැවින් නොපමාව දුකින් මිදීම පිණිස කුසල ධර්ම සම්පූර්ණ කරන්න.
ඉහත ප්‍රකාශය

(1) බුදුන් වහන්සේගේ ප්‍රථම අවවාදයයි
(2) බුදුන් වහන්සේගේ අන්තිම අවවාදයයි
(3) බුදුන් වහන්සේගේ ප්‍රථම උදානයයි
(4) බෝසතාණන් වහන්සේගේ ප්‍රථම උදානයයි

(2) බුදු රජාණන් වහන්සේගේ ස්ථානෝචිත ප්‍රඥාවට නිදසුනකි.

(1) නන්ද කුමරුට ශාසන ඇල්ම ඇති කිරීම සඳහා යොදන ලද ක්‍රියාමාර්ගය.
(2) දේවදත්ත හිමිගේ ක්‍රියාකලාපයට ගන්නා ලද නිගමනය
(3) දෙමාපිය අවසරයකින් තොරව දරුවන් පැවිදි නොකරන්නැයි සුදොවුන් රජු කළ ඉල්ලීමට ප්‍රතිචාර දැක්වීම
(4) අක්කෝසක භාරද්වාජ, චිංචි මානවිකා ආදීන්ගේ නින්දා හමුවේ කම්පාවට පත් නොවීම.

(3) සැදැහැවතුන් ඉතා දුර බැහැර සිට වෙහෙස වී ශ්‍රද්ධාවෙන් රැගෙන එන සිවුපසය පිළිගැනීමට භික්ෂූන් වහන්සේලා සතු සඝ ගුණය

(1) ආහුනෙය්‍ය (2) පාහුනෙය්‍ය (3) දක්ඛිණෙය්‍ය (4) අඤ්ජලීකරණීය

(4) බුදු රජාණන් වහන්සේ නිරෝධ සමාපත්තියෙන් වැඩ සිටි මුතියංගන සිද්ධස්ථානය පිහිටියේ,

(1) ඌව පළාත බදුල්ල දිස්ත්‍රික්කයේය
(2) දකුණු පළාත හම්බන්තොට දිස්ත්‍රික්කයේය
(3) උතුරු පළාත අනුරාධපුර දිස්ත්‍රික්කයේය
(4) නැගෙනහිර පළාත අම්පාර දිස්ත්‍රික්කයේය

(5) සිදුහත් කුමරු වප් මඟුල් දින දඹ රුක් සෙවනේ පළඟ බැඳගෙන වඩන ලද්දේ,

(1) බුද්ධානුස්සති භාවනාවයි (2) ධම්මානුස්සති භාවනාවයි
(3) මෛත්‍රී භාවනාවයි (4) ආනාපානාසති භාවනාවයි

(6) මහරජ මේ අපේ වංශයේ සිරිතයි. අපේ වංශය බුද්ධ වංශයයි. එහි චාරිත්‍රය මෙයයි. බුදු රජාණන් වහන්සේ මේ ප්‍රකාශය සිදුකරන ලද්දේ,

(1) කොසොල් රජතුමාටය (2) අනේපිඬු සිටුතුමාටය

(3) සුදොවුන් රජතුමාටය (4) සුප්‍රබුද්ධ රජතුමාටය

(7) අන් අයගේ දියුණුව දැක එම දියුණුව තමාට ඇති වූවක් සේ සලකා සතුටට පත් වන ස්වභාවය

(1) මෙත්තාවයි (2) කරුණාවයි (3) මුදිතාවයි (4) උපේක්ෂාවයි

(8) සමමා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව යන මාර්ගාංග ත්‍රී ශික්ෂාවෙහි ඇතුළත් වන්නේ,

(1) සීල ශික්ෂාවටයි (2) සමාධි ශික්ෂාවටයි

(3) ප්‍රඥා ශික්ෂාවටයි (4) උතුම් ශික්ෂාවටයි

(9) සමාජ යුතුකම් පිළිබඳව කියා දෙන සිගාලෝවාද සූත්‍රයේ ''වැඩ කටයුතු ඉතා මැනවින් ඉටු කිරීම'' අයත් සමාජ කොටස වන්නේ,

(1) දෙමාපිය දූදරුවන් (2) බිරිඳ ස්වාමියා

(3) ගුරු ශිෂ්‍ය (4) සේව්‍ය සේවක

(10) බලංගොඩ ආනන්ද මෛත්‍රීය මහා නායක හිමියන්ගේ තනතුරු හා ගෞරවනාමයක් නොවන්නේ,

(1) සාහිත්‍යය ශූරී (2) අග්ගමහා පණ්ඩිත

(3) සාහිත්‍යය චක්‍රවර්තී (4) ලංකා පුත්‍ර

(11) අටලෝ දහමෙහි කීර්තිය හා අපකීර්තිය අර්ථවත් වන්නේ,

(1) ලාභ අලාභ (2) යස අයස

(3) නින්දා ප්‍රශංසා (4) සැප දුක

(12) අතීත ශ්‍රී ලංකාවේ පැවැති ස්වයංපෝෂිත කෘෂි ආර්ථික රටාවේ පදනම වූයේ,

(1) වැව් හා වාරි පද්ධතියයි (2) පරාර්ථ චර්යාවයි

(3) රාජ්‍ය පාලනයයි (4) නවීන තාක්ෂණයයි

(13) ත්‍රිවිධ තෘෂ්ණාව තුළ මතු පැවැත්මක් හා පුනර්භවයක් නැත යන උච්චේද දෘෂ්ඨිය මුල්කොට ගෙන මෙලොව හැකි තාක් සැප විඳීමට ඇති ආශාව අර්ථවත් වන්නේ,

(1) කාම තණ්හාව තුළය (2) භව තණ්හාව තුළය

(3) විභව තණ්හාව තුළය (4) රාග තණ්හාව තුළය

(14) දුකට මුල්වන්නා වූ තෘෂ්ණාව මුළුමනින්ම නැසීමක් වේද අත් හැරීමක් වේද, විදීමක් වේද, එහි නොඇලීමක් වේද යන අදහස චතු සත්‍යයෙහි හැඳින්වෙන්නේ,

(1) දුක්ඛ ආර්ය සත්‍යයෙහිය

(2) සමුදය ආර්ය සත්‍යයෙහිය

(3) නිරෝධ ආර්ය සත්‍යයෙහිය

(4)නිරෝධ ගාමිණී පටිපදා ආර්ය සත්‍යයෙහිය

(15) දුන් දෙයෙහි විපාක නැත. කළ හොඳ නරක වල විපාක නැත. මොලොවක් පරලොවක් නැත. යනාදී වශයෙන් විස්තර වන්නේ,

(1) දස වස්තුක මිච්ඡා දිට්ටයියයි

(2) චතු සච්ච සම්මා දිට්ටයියයි

(3) සම්මා කම්මන්තයයි

(4) දස වස්තුක සම්මා දිට්ටයියයි

(16) සතර සතිපට්ඨානයෙහි පංච නීවරණ ආදී ධර්මවල සිහිය යෙදවීම.

(1) කායානුපස්සනාවයි

(2) වේද නානුපස්සනාවයි

(3) චිත්තානුපස්සනාවයි

(4) ධම්මානුපස්සනාවයි

(17) චිංචි මානවිකාවගේ සිදුවීම නිසා බුදු රජාණන් වහන්සේ අපවාදයට ලක්වීමට හේතු වූ පෙර කර්මය,

(1) සරභූ නම් පසේ බුදු රජාණන්ට කළ අපහාසය

(2) නන්ද නම් ශ්‍රාවකයන් වහන්සේට ''කාමභෝගියා'' යයි දොස් නැගීම නිසා

(3) ඥාතීන් මසුන් ගොඩදානු දැක සතුටු සිනා පළ කළ නිසා

(4) වෛද්‍යවරයකුව සිටියදී සිටුවරයකුට විරේක බෙහෙත් දී මුදල් ලබා ගැනීම නිසා

(18) පටිච්ච සමුප්පාදයෙහි හේතුඵල ධර්මය පිළිබඳ කෙටි සූත්‍රයෙහි ''ඉමස්මිං අසති ඉදං න හෝති'' යන්නෙහි තේරුම,

(1) මෙය ඇතිකල්හි මෙය නොවේ.

(2) මෙය නැති කල්හි මෙය නොවේ.

(3) මෙය නැතිව යාමෙන් මෙය නැතිව යයි.

(4) මෙය හට ගැනීමෙන් මෙය හට ගනී.

(19) දෙවන ධර්ම සංගායනාවට මූලික වූ ඇකැප දස වස්තුව අනුගමනය කළේ,

(1) මල්ල රජ දරුවන්ය

(2) ලිච්ඡවී රජ දරුවන්ය

(3) වජ්ජි පුත්තක භික්ෂූන් වහන්සේලාය

(4) කාකණ්ඩ පුත්ත යස හිමියන් ඇතුළු පිරිස

(20) සඳකඩ පහණට දෙපසින් පිහිටුවා ඇති සෘජුකෝණාස්‍රාකාර ගල් පුවරු දෙක හඳුන්වන්නේ,

(1) බෝධිසර නමිනි

(2) ප්‍රතිමාසර නමිනි

(3) චෛතියසර නමිනි

(4) මුරගල් නමිනි

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව / தென் மாகாணக் கல்வித் திணைக்களம்
DEPARTMENT OF EDUCATION SOUTHERN PROVINCE

තෙවන වාර පරීක්ෂණය - 2021

| 09 ශ්‍රේණිය | බුද්ධ ධර්මය | කාලය පැය |
|---|---|---|

නම/ විභාග අංකය :- ..................................................................................................................

**II** කොටස

- පළමු වැනි ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

(1) (i) කෝට්ටේ යුගයේදී ගුත්තිල ජාතකය ඇසුරින් රචිත ගුත්තිල කාව්‍ය නම් ග්‍රන්ථයේ කතුවරයා නම් කරන්න.

(ii) ආකාරවතී ශ්‍රද්ධාව යනු කුමක්ද?

(iii) රාජ්‍ය පාලනයේදී දානය, සීලය, පරිත්‍යාගය, ඍජුබව........ ආදී කරුණු දහමේ හඳුන්වන නම කුමක්ද?

(iv) අධාර්මික වෙළඳාමෙහි භාවිතා කරන ''මානකූට'' යනු කුමක්ද?

(v) තෙවන ධර්ම සංගායනාවට අනුග්‍රහය දැක්වූ රජතුමා නම් කරන්න.

(2) (i) බුදු සිරිතෙහි විශිෂ්ට ලක්ෂණ දෙකක් ලියන්න.

(ii) ඔබ නම් කළ එක් විශිෂ්ට ලක්ෂණයක් කෙටියෙන් ලියන්න.

(iii) ශිෂ්‍ය ජීවිතය ඔපවත් කර ගැනීම සඳහා බුදු සිරිතෙහි විශිෂ්ට ලක්ෂණ අදාළ කරගත හැකි ආකාරය විස්තර කරන්න.

(3) (I) සොළොස්මස්ථාන අතරින් දෙකක් නම් කරන්න.

(ii) වන්දනා ගමන් වලදී නොකළ යුතු කටයුතු තුනක් ලියන්න.

(iii) ඔබ ගිය වන්දනා ගමනකදී වන්දනා කටයුතු සිදු කළ ආකාරය විස්තර කරන්න.

(4) (i) පහත ධම්මපද ගාථාවේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.

සුඛරානී අසාධූනී - අත්තනෝ අහිතානිච

.......................................................................

(ii) එම ධම්ම පද ගාථාවේ තේරුම ලියන්න.

(iii) ධම්මපද ගාථා වලින් අප ජීවිතයට ගත හැකි උපදෙස් විස්තර කරන්න.

(5) (i) ආර්ය අෂ්ටාංගික මාර්ගයේ අංග අටෙන් දෙකක් ලියන්න.

(ii) වචනයෙන් සිදුවන වැරදි ඇතුලත් මිච්ඡා වාචාවට අයත් අංග හතරෙන් තුනක් ලියන්න.

(iii) ජීවිත අරමුණු ජය ගැනීමට ''උත්සාහය'' කෙතෙක් දුරට ඉවහල් වේ දැයි විස්තර කරන්න.

(6) (i) මහා ප්‍රජාපතී ගෝතමී තෙරණිය ශාසනයේ දැරූ තනතුරක් ලියන්න.

(ii) ප්‍රජාපතී ගෝතමී තෙරණියගෙන් ගත හැකි ආදර්ශ තුනක් ලියන්න.

(iii) භික්ෂුණී ශාසනය පිහිටුවීම සඳහා ප්‍රජාපතී ගෝතමිය ක්‍රියාකළ ආකාරය විස්තර කරන්න.

(7) පහත සඳහන් මාතෘකා වලින් දෙකක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

(i) සිව් බඹ විහරණ

(ii) ආරෝග්‍යා පරමා ලාභා

(iii) ගිහි පැවිදි යුතුකම්

(iv) අටලෝ දහම

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது.
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව / தென் மாகாணக் கல்வித் திணைக்களம்

DEPARTMENT OF EDUCATION SOUTHERN PROVINCE

තෙවන වාර පරීක්ෂණය - 2021

09 ශ්‍රේණිය

බුද්ධ ධර්මය

පිළිතුරු පත්‍රය

## I කොටස

| | | | |
|---|---|---|---|
| (1) 2 | (6) 3 | (11) 2 | (16) 4 |
| (2) 1 | (7) 3 | (12) 1 | (17) 1 |
| (3) 1 | (8) 1 | (13) 3 | (18) 2 |
| (4) 1 | (9) 4 | (14) 3 | (19) 3 |
| (5) 4 | (10) 4 | (15) 1 | (20) 4 |

(ලකුණු 2 x 20 = 40 යි)

## II කොටස

(1) (I) වැත්තෑවේ හිමියන්

(ii) ත්‍රිවිධ රත්නය කෙරෙහි පදනම් සහිතව ඇතිවන පැහැදීමයි

(iii) දස රාජ ධර්ම

(iv) හොර මිණුම් උපකරණ භාවිතය

(v) ධර්මාශෝක රජතුමා

(ලකුණු 4x 5 = 20)

(2) (i) පෙළ පොතේ 2 පාඩමෙහි විශිෂ්ට ලක්ෂණ 15 ක් දැක්වේ. ඉන් විශිෂ්ට ලක්ෂණ දෙකක් ලියා ඇත්නම් ලකුණු දෙන්න. (ලකුණු 02)

(ii) අපේක්ෂකයා නම් කළ එක් විශිෂ්ට ලක්ෂණයක් කෙටියෙන් පැහැදිලි කර ඇත්නම් ලකුණු දෙන්න. පෙළ පොතේ 2 පාඩම (ලකුණු 03)

(iii) 2 පාඩමෙහි දක්වා ඇති විශිෂ්ට ලක්ෂණ තේරුම් ගෙන එම විශිෂ්ට ලක්ෂණ ශිෂ්‍ය ජීවිතය ආලෝකමත් කර ගැනීම සඳහා උපයෝගී කර ගන්නා ආකාරය ලියා ඇති පිළිතුරකට ලකුණු ලබා දෙන්න. විශිෂ්ට ලක්ෂණ වල පවත්නා සර්වකාලීන වටිනාකම් හැදිනගෙන තම ජීවිතය සකස් කර ගැනීමට ඉවහල් කර ගන්නා ආකාරය පැහැදිලි කළ යුතුයි. (ලකුණු 05)

(3) (I) මහියංගනය, නාගදීපය, කැළණිය, ශ්‍රී පාදස්ථානය, දිවාගුහාව, දීඝවාපිය, මුතියංගනය, තිස්සමහාරාමය, ශ්‍රී මහා බෝධිය, මිරිස වැටිය, රුවන් වැලි සෑය, ථූපාරාමය, අභය ගිරිය, ජේතවනය, මිහින්තලය, කතරගම කිරිවෙහෙර මින් දෙකක් (ලකුණු 02)

(ii) පූජනීය ස්ථාන වල නම් ගම් සටහන් කිරීම
අන් අයට කරදර වන සේ කෑ කෝ ගැසීම
නුසුදුසු ආහාර පාන භාවිතය
නොගැළපෙන වදන් භාවිතය
නුසුදුසු ගීත ගායනයෙන් හා වාදනයෙන් වැළකීම (ලකුණු 03)

(iii) අපේක්ෂකයා සහභාගී වූ වන්දනා ගමන් හෝ ගමනක් පිළිබඳව ලියා ඇති කරුණකට ලකුණු ලබා දෙන්න. (ලකුණු 05)

(4) (i) සුකරානී අසාධූනී
අත්තනෝ අහිතානිච
යං මේ හතංච සාධුංචෙ
පරම තං වේ පරම දුක්කරං (ලකුණු 02)

(ii) අයහපත් දෑ මෙන්ම තමාට අහිත පිණිස හේතුවන දෑ ද පහසුවෙන් කළ හැකිය. යහපත් දෑ මෙන්ම තමාට හිතකර වූ දේ කිරීම ඉතාම දුෂ්කරය. (ලකුණු 03)

(iii) ධම්මපදය පිළිබඳ මූලික හැඳින්වීම.
සූත්‍ර පිටකයේ ඛුද්දක නිකායට අයත් බව
ගාථා 423, වග්ග 26
උගත් නූගත් සැමටම ගෝචර වන පරිදි ලියවී ඇත. ධම්ම පදයේ ඉදිරිපත් කරන ගාථා දෙකින් යහපත් දෑ කළ හොත් යහපත් ප්‍රතිඵල ලැබිය හැකි බවද අයහපත් දෑ කළහොත් අයහපත් ප්‍රතිඵල ලැබිය හැකි බවද විස්තර වේ. එම නිසා අප නිරතුරුම යහපත් දෑ පමණක් කළ යුතු බව විස්තර වන පිළිරකට ලකුණු දෙන්න. (ලකුණු 05)

(5) (i) සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා සති, සම්මා සමාධි (ලකුණු 02)

(ii) මුසාවාදා වේරමණී, පිසුණාවාචා වේරමණී, පරුසාවාචා වේරමණී, සම්ඵප්පලාපා වේරමණී මින් තුනක් (ලකුණු 03)

(iii) ශිෂ්‍ය ජීවිතයේ අභියෝග ජය ගැනීමට උත්සාහයෙන් කටයුතු කළ යුතු අතර ජීවිත අරමුණු ජය ගැනීම සඳහාද උත්සාහය අවශ්‍ය වේ. සම්මා වායාමයෙන් හෙවත් නිවැරදි උත්සාහයෙන් කටයුතු කිරීම තුළින් මෙලොව පරලොව අභිමතාර්ථ ජය ගැනීමට කටයුතු කළ යුතු ආකාරය පැහැදිලි කර ඇත. එහිදී යහපත් උත්සහය සම්මා ව්‍යාමය ලෙස දක්වා ඇත. (ලකුණු 02)

(6) (I) චිරරාත්‍රඥ භික්ෂුණීන් අතර අග තනතුර (ලකුණු 02)

(ii) සැබෑ දාරක ස්නේහයෙන් යුතු ගුණ ගරුක මවක් වීම.
අධිෂ්ඨාන පූර්වකව කටයුතු කිරීම.
වඩාත් සාමකාමී පිළිවෙතකින් ඉල්ලීම දිනා ගැනීමට කටයුතු කිරීම.
අනතිමානී ගුණයෙන් යුක්ත වීම.
නිසි නායකත්වය හා කැපවීම.
නිරහංකාර බව. (ලකුණු 03)

(iii) මහා ප්‍රජාපතී ගෝතමී තෙරණිය බෝසතාණන් වහන්සේගේ සුළු මවයි. එතුමිය මහාමායා දේවිය කළුරිය කළ දින සිට බෝසතාණන් වහන්සේව රැකබලා ගන්නා ලදී. පැවිදි වීමේ අපේක්ෂාවෙන් ශාක්‍ය කුමාරිකාවන් 500 දෙනෙකු සමග යොදුන් එකසිය පණහක් දුරගෙවා විශාලා මහනුවර කූටාගාර ශාලාව දක්වා ගමන්කොට ආනන්ද හිමිගේ අනුග්‍රහයෙන් අෂ්ට ගරු ධර්ම පිළිගැනීමෙන් අනතුරුව පැවිදි උපසම්පදාව ලබාගන්නා ලදී. රහත්භාවයට පත්වීම ශාසනයේ තනතුරු ලැබීම, භික්ෂුනී සමාජයේ ප්‍රධානියා බවට පත් වීම ආදී තොරතුරු ලියා ඇති පිළිතුරකට ලකුණු ලබා දෙන්න. (ලකුණු 05)

(7) (i) පෙළ පොතේ 8 පාඩම බලා ප්‍රමාණවත් කරුණු ලියා ඇති පිළිතුරකට ලකුණු ලබා දෙන්න. (ලකුණු 05)

(ii) පෙළ පොතේ 19 පාඩමට අදාළව ප්‍රමාණවත්ව කරුණු ලියා ඇති පිළිතුරකට ලකුණු ලබා දෙන්න. (ලකුණු 05)

(iii) පෙළ පොතේ 10 පාඩමේ 64, 65, 66 පිටු කියවා ප්‍රමාණවත් පිළිතුරකට ලකුණු ලබා දෙන්න. (ලකුණු 05)

(iv) පෙළ පොතේ 12 පාඩම කියවා ප්‍රමාණවත්ව ලියා ඇති පිළිතුරකට ලකුණු ලබා දෙන්න. (ලකුණු 05)